# A source-based study of the meaning and usage of the term 'citta' in early Buddhism

## ආදි බුදුසමයෙහි දැක්වෙන චිත්ත පදයෙහි අර්ථය හා එහි භාවිතය පිළිබඳ මූලාශ්‍රයාගත අධ්‍යයනයක්.

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

**ප්‍රවේශය**

බුදුසමය තුළ විග්‍රහවන්නා වූ පුද්ගල මානසික පදාර්ථය පිළිබඳ විමසීමේ දී එහි භාවිතය දැක්වීම සඳහා ආදි බුදුසමය තුළ නොයෙකුත් පර්යාය පදයන් හමු වේ. බුදුරජාණන් වහන්සේගේ ධර්ම විග්‍රහය තුළ පර්යාය දේශනා විලාසය නිරන්තරයෙන් දක්නට ලැබෙන්නකි.[1] මෙම ක්‍රමයට අනුව ආදි බුදුසමය තුළ මානසික පදාර්ථ විග්‍රහයේ දී ප්‍රධාන වශයෙන් පර්යාය පද 03 ක් දක්නට ඇත. එනම්

- චිත්ත
- මනෝ
- විඤ්ඤාණ [2]

යන පදයි. මීට අමතරව අභිධර්ම පිටකය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී මෙම පදයන්ට අමතරව "මනස", "හදය", "පණ්ඩර", "මනායතන", "චිත්ත", "මනො", "විඤ්ඤාණක්ඛන්ධ", "තජ්ජමනො", "විඤ්ඤාණධාතු" යන පර්යාය පද රාශියක් ද මෙම පුද්ගල මානසික අංශය හැඳින්වීම සඳහා භාවිත කොට ඇත.[3] මෙහි "මනො" යනුවෙන් දක්වා ඇත්තේ පසිඳුරන්ට ගොදුරු වන අරමුණ මැනීමෙන් හඳුනාගනු ලබන දෙයයි.[4] "මානස" යනු "මන" යන තත්වයම වේ. අහස්කුස හැසිරෙන යම් රාගය නැමැති පාසයක් වේද එසේ හැසිරෙන්නේ මානස යන තත්‍වය බව සංයුක්ත නිකායෙහි දැක්වේ.[5] මෙහි දී සම්ප්‍රයුක්ත ධර්මයෝ මානස නමින් දක්වා ඇත.[6] "හදය" යනුවෙන් දැක්වෙන්නේ ද සිතමය.[7] "***චිත්තං වා තෙ ඛිපිස්සාමි, හදයංවා තෙ ඵාලෙස්සාමීති***"[8] යන අවස්ථාවේ දී "හදය" යනුවෙන් ළය, හදවත අර්ථවත් කොට ඇති නමුත් "***හදයා හදයං මඤ්ඤෙ අඤ්ඤාය තච්ඡති***" යනුවෙන් අනඞ්ගණ සූත්‍රයේ දැක්වෙන "අන්‍යයන්ගේ හදවත හඳුනාගෙන සිත තුනී කරයි" යන අවස්ථාවේ "හදය" යන්න "චිත්ත" යන අර්ථයෙන් යොදා ඇත. එසේම "පණ්ඩර" යන්න අංගුත්තර නිකායෙහි දැක්වෙන පරිදි ප්‍රභාස්වර සිතයි. සුදු හා පිරිසිදු යනු ප්‍රභාස්වර යන්නට සමානාර්ථවාචී පදයන්ය. නිල් ආදි වර්ණයක් එහි නොමැත. කෙලෙස්වලින් බැහැර වීම නිසා සුදු වූයේ යනුවෙන් දක්වා ඇත. මෙය පසුකාලීනව සංවර්ධනය වූ "භවංග චිත්තය" ලෙස ද දක්වයි. මෙය බැහැරින් එන්නා වූ කෙලෙසුන්ගෙන් කිලිටි වේ.[10] මෙහිදී ද මෙම භවංග අවස්ථාව පණ්ඩර නමින් දක්වා ඇත. "මහායතන", "මන" යන්නට බැසගැනීම සඳහා මනසම ආයතනයක් බව දැක්වීම සඳහා මහායතන යන පදය දක්වා ඇත.[11] අරමුණු හා ඉන්ද්‍රියන් රාශිගත වනුයේ මනායතනයෙහිය. එබැවින් මනායතනය යනු එකතු වන තැන යන අර්ථවාචී පදයක් බව අදහස් කළ

හැක. "මන" යන්නට එය ආයතනයක් වනුයේ වාසස්ථාන වූ බැවින් ද (නිවාසනට්ඨෙන) උප්පත්තිස්ථාන වූයෙන් ද (ආකරට්ඨෙන) බාහිර රූපාදි අරමුණු සිත හා එක්ව හැසිරීම් යන අර්ථයෙන් ද (සමොසරණඨානට්ඨාන) ස්පර්ශය ආදි ධර්මයන්ට හටගැනීම් හා හේතු අර්ථයෙන් ද (සඤ්ජාතිදෙසට්ඨෙන කාරණට්ඨෙන) බව අටුවාවෙහි දක්වා ඇත. "විඤ්ඤාණං" යනුවෙන් දැක්වූයේ අරමුණු හඳුනා ගැනීමයි.[12] එනම් සැප, දුක, උපේක්ෂාව හඳුනා ගැනීමයි. එම නිසා එම අර්ථයෙන් "විඤ්ඤාණ" යන යෙදීම භාවිතා වන බව මහාවේදල්ල සූත්‍රයෙහි දැක්වේ.[13] අරමුණු රසය සැප, දුක, හා උපේක්ෂාව වශයෙන් දැනගැනීමත් විඤ්ඤාණයෙහි කාර්යයක් බව දැක්වේ. විඤ්ඤාණක්ඛන්ධ" යන්නෙහි අදහස "විඤ්ඤාණ රැස් වූ ස්ථානය"[14] යන්නයි. එසේම තජ්ජමනොවිඤ්ඤාණධාතු මානසිකත්‍වය විග්‍රහ කරනුයේ ස්පර්ශය ආදි ධර්මයන්ට යෝග්‍යභාවය හා විමසනු ලබන බැවිනි.[15]

බුදුසමය තුළ මෙසේ පර්යාය පද රාශියකින් විග්‍රහ කරනුයේ එක් මානසික පදාර්ථයක් පිළිබඳව ද එසේ නොමැතිනම් ඒ තුළ විවිධත්‍වයන් දක්නට ලැබේද යන්න බොහෝ උගතුන් අතර සාකච්ඡාවට භාජනය වූ කරුණකි. මේ පිළිබඳ පුළුල්ව අධ්‍යයනය කිරීමේ දී උක්ත පදයන් අතර සියුම් වූ වෙනසක් දක්නට ඇති බව පෙනී යයි බොහෝ උගතුන්ගේ මතයයි.

## "චිත්ත" පදයෙහි අර්ථය හා භාවිතය

ආදි බුදු සමය තුළ බොහෝ සෙයින් යෙදී ඇති පදයක් ලෙස "චිත්ත" යන්න දැක ගත හැක. මෙය පුද්ගල මානසිකත්වය තුළ ඉන්ද්‍රියාර්ථානුභාවය (අරමුණු විඳීම) නම් අර්ථය සහිත "චිත්" ධාතුවෙන් නිපන් පදයකි. මෙම වචනය හා බැඳුණු වැදගත් සංකල්ප රාශියක් බුදුසමය තුළ දැකිය හැකිය. විවිධ අවස්ථාවන්හි සිදුකොට ඇති විවරණ අනුව "චිත්ත" යන සංකල්පයට නිශ්චිත අරුතක් දැක්වීම අපහසුය. නමුත් ආදි බුදුසමය දෙස විමසීමේ දී "චිත්ත" යන පදය බොහෝ සෙයින් යෙදී ඇත්තේ භාවාර්ථය හැඟවීම සඳහාය. බටහිර මනෝ විද්‍යාවේ සිතේ ක්‍රියාකාරිත්වය අර්ථ 05 කින් යුක්තවන බව දක්වා ඇත.

01. සිතීම

02. චිත්තාවේග ඇතිවීම

03. ප්‍රජානනය

04. සංචේතනය

05. සංවේදනය

ආදි බුදුසමයේ දැක්වෙන "භාවාර්ථය" යනු ද මෙම අර්ථ සියල්ලම එකතු වූ අවස්ථාවකි. බෞද්ධ විමුක්ති මාර්ගය සමඟ ඍජුවම සම්බන්ධ වී ඇත්තේ "චිත්ත" යනුවෙන් දැක්වෙන පුද්ගල මානසික අංශයයි. ඇස, කන, නාසය, දිව, ශරීරය යන පසිඳුරන් මඟින් ගෝචර කරගනු ලබන රූප, ශබ්ද. ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු තුළ මෙම "චිත්ත" විචිත්‍ර වන බැවින් මේ සඳහා "චිත්ත" යන්න භාවිත කොට

ඇත. මෙහි ස්වාභාවය පැහැදිලි කිරීමේ දී එය ප්‍රකෘතියෙන්ම ප්‍රභාස්වර වූ, අචල වූ, නිමල වූ, පිවිතුරු එකකි. ඉන්ද්‍රියන් මගින් බාහිර ලෝකය හා ගැටීම් හේතුවෙන් "චිත්ත" කෙලෙසුන්ගෙන් කිලිටි භාවයට පත්වේ. මෙය නොදත් පුහුදුන් පුද්ගලයාට කිසිදා චිත්ත වර්ධනයක් ලැබිය නොහැකිය. ***"පභස්සර මිදං භික්ඛවෙ චිත්තං. තං ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං"***[16] සත්‍වයා බාහිර විෂය ලෝකය පිළිබඳ ඥානය ලබාගන්නේ ඉන්ද්‍රියානුසාරයෙනි. ඒවා අවිචාරවත්ව ග්‍රහණය කිරීමට යොමු වීමෙන් තෘෂ්ණා දෘෂ්ටි මනාදී කෙලෙස් ධර්මයෝ පහල වෙති.[17] මෙහි දී පුද්ගලයා චිත්ත සංවරයක් ඇතිකර ගත යුතු වේ. ඒ සඳහා ද භාවිත හා අභාවිත චිත්තයක් ජනිත කරගත යුතු වේ. භාවිත හා අභාවිත යන යෙදුම චිත්ත හා සම්බන්ධයෙන් යෙදී ඇති ආකාරය මුලික සූත්‍ර දේශනා තුළ දැකගත හැකි වේ.

**"මනාව සෙවිලි නොකරන ලද ගෙය තුළට වැහි බිඳු පතිත වන්නා සේ, අභාවිත චිත්තය තුළට රාගාදී වූ කෙලෙස් ජනිත වේ. එසේම භාවිත වූ චිත්තය කෙරෙහි කවර ආකාරයකින් වුව ද එසේ ඇති නොවේ."**[18]

මීට අමතරව "චිත්ත" ස්වාභාවය පිළිබඳ විවිධ වූ හැඳින්වීම් ආදි බුදුසමය තුළ දැකගත හැක.

**"කැළඹුන ජලය ඇති විලක් යම්සේ ද, එසේම සසල වූ චිත්තය යථාර්ථය දැකීමට අපහසු වේ."**

**"අනාරක්ෂිත තිදොරින් යුක්ත වූ පුද්ගලයාගේ සකල ක්‍රියාවෝ අකර්මණ්‍ය වෙති."**

**"නිබඳ පෙරළෙන සුළු මේ සිත උපමාවකින් මෙබඳු යැයි පැවසීම දුෂ්කරය."**

**"රෞද්‍ර වූ ගති ලක්ෂණවලින් යුත් සිතුවිලි ප්‍රචණ්ඩත්වයට නැඹුරු වේ."**

**"අභාවිත සිතැත්තා ඉතා සුළු දෙයකින් වුව ද ප්‍රකම්පිත වේ."**

පෙළ දහම තුළ මෙසේ සිත පිළිබඳ දැක්වෙන විශේෂ වූ දේශනා එකතු කොට නිර්මාණය වූ ඛු.නි. ධම්මපද පාළියෙහි චිත්ත වර්ගයෙහි සිතේ ඇති සුවිශේෂ ලක්ෂණ හා ගුණාංග කීපයක් හඳුනාගත හැක.

- "දූරඞ්ගමං" (දුර ගමන් යන්නා වූ)
- "එකචරං" (තනිව හැසිරෙන ස්වභාව කොට ඇති)
- "අසරීරං" (ශරීරයක් නොමැත්තා වූ)
- "ගුහාසයං" (ශරීරය තුළ වසන බව)
- "ඵන්දනං" (සෙලවන බව)
- "චපලං" (චපල වූ අස්ථාවර ස්වභාවය)
- "පරිඵන්දති" (හැම අයුරින්ම සැලීමට පත්වීම)
- "දූරක්ඛං" (රැකීමට අපහසු)

- "දුන්නිවාරයං" (අරමුණු ගැනීම වැළැක්විය නොහැකි)
- "සුදුද්දසං" (දැක්මට, අවබෝධ කිරීමට ඉතා අපහසු)
- "යත්‍ථකාම නිපාතිනං" (කැමති තැනක වැටේ)
- "දුන්නිග්ගහස්ස ලහුනො" (ලේසියෙන් අල්ලා ගැනීමට අපහසු)

මේ අනුව සිත එක්තරා යාන්ත්‍රික ක්‍රියාකාරකමකට යටත්ව කටයුතු කරන බවක් පෙනේ. සිත අරමුණු ගැනීම නොවැළැක්විය හැකි දෙයකි. එය කැමති තැනකට යයි. නිතර සැලෙන වේගවත් වූ ක්‍රියාකාරීත්වයක් ඇත. මේ ස්වභාවයන් අවබෝධ කිරීම චිත්ත දමනය ඇතිකර ගැනීමේ මූලික පියවරයි. ඉහත ලක්‍ෂණ දක්වා ඇත්තේ "චිත්ත" යන ව්‍යවහාරයට සම්බන්‍ධකර මිස "මනෝ" හෝ "විඤ්ඤාණ" යන්නට සම්බන්‍ධ කරමින් නොවේ. සිතෙහි අරමුණු ගැනීමේ ක්‍රියාවලියත් (දුන්නිවාරයං) සිත රැකීමත්, (දුරකඛං) දැකීමත් (සුදුද්දසං) වැළැක්විය හැකි කාරණා ලෙස විග්‍රහ නොවේ. නමුත් එය ඉතා අපහසු බවක් දක්වා ඇත. මීට අමතරව සිත වර්ධනය කරන්නා වූ ධනාත්මක අගයෙන් යුතු ව්‍යවහාරයන් ද ධම්මපදයේ චිත්ත වග්ගය තුළ ඇතුළත්ව ඇත. එම වචන මඟින් අපේක්‍ෂිත කාර්යය පුද්ගලයා තුළ ප්‍රඥාව වර්ධනය කරලීමයි. ප්‍රඥාව වර්ධනය කරවීමේ ක්‍රියාවලිය ලෙස බුදුසමය අදහස් කරන තත්‍වය සදාචාර පැවැත්ම හා බද්ධ වූවකි. ත්‍රිවිධ ශික්ෂාවේ දී ශීලය මූලිකව දක්වා ඇත. සිතෙහි චර්යාව වෙනස් කිරීමට සම්බන්ධ ශිලමය අංශයට යොමු වූ ක්‍රියාමාර්ග කිහිපයක් චිත්තවර්ගයේ හමු වේ.

- "උජුං කරොති" (සිත ඍජු කිරීම)
- "චිත්තස්ස දමථො" (සිතෙහි දමනය ඇති කිරීම)
- "චිත්තං රක්ඛෙථ" (සිත ආරක්‍ෂා කිරීම)
- "චිත්තං සඤ්ඤමෙස්සන්ති" (සිතේ සන්‍යමය ඇති කිරීම)
- "සම්මා පණිහිතං චිත්තං" (සිත මානව යෙදීම)
- "නගරූපමං චිත්ත මිදං ඨපෙත්‍වා" (ආරක්‍ෂක විධිවිධාන යෙදීම)

මෙසේ ශීලය පදනම් කොටගෙන හික්මෙන්නා වූ සිත කැළඹීමෙන් තොරය. එබඳු වූ චිත්තයකින් පමණක් ප්‍රඥාව වෙත යොමු විය හැකිය. එසේම මෙහි අනෙක් පැතිකඩක් ද ඇත. එනම් ප්‍රතිවිරුද්ධ වූ මිත්‍යා අංශයට සිත යෙදවීමයි. එසේ අයහපතෙහි යෙද වූ සිත නිසා මිනිසා වෙනත් කිසිවෙකුටත් තමා වෙත සිදුකළ නොහැකි වූ තරම් අයහපතක් තමා විසින්ම තමාට සිදුකරගනු ලබයි.[19] එම ක්‍රියාවන්හි අහිතකර ඵල විපාකයන් මුළු මහත් සමාජයටම විඳීමට සිදුවනු ඇත. එසේම චිත්ත වග්ගය තුළ "චිත්තය" අනවස්සුත චිත්ත හා අනවට්ඨීක චිත්ත යනුවෙන් කොටස් දෙකක් දක්වා ඇත.[20] මෙහි දී රාගයෙන් ද්වේෂයෙන් නොගැටුණා වූ චිත්තය අනවස්සුක චිත්තය නම් වේ. රාගයෙන් හා ද්වේශයෙන් යුක්ත වූ චිත්තය අනවට්ඨීත චිත්තය ලෙස දක්වා ඇත. මේ දෙයාකාර වූ චිත්ත ස්වභාවයන් පුද්ගලයා කෙරෙහි යහපත හා අයහපතෙහි මූලිකත්‍වය දරයි. ප්‍රඥාව වර්ධනය කිරීම සඳහා සිත පිහිටුවීම අත්‍යාවශ්‍ය කරුණක් වේ. ඒ සඳහා සිත දමනය කිරීම පණ්ඩිත පුරුෂයා විසින් නිරන්තරයෙන්ම උත්සහ කටයුත්තේය.[21]

සංයුක්ත නිකායේ දැක්වෙන අයුරින් පුද්ගල කය විනාශවන සුළු වුව ද ශ්‍රද්ධා, ශීල, ශ්‍රුත, ත්‍යාග යන ගුණධර්මයන්හි පුරුදු කරන ලද සිත විනාශ නොවී දීර්ඝ කාලයක් හිතසුව පිණිස පවතියි.[22] මෙහි දී "චිත්ත" යන්න භවගාමි දැයි සැකයක් මතුවිය හැක. නමුත් ඉහත දේශනාව තුළින් සිතේම ක්‍රියාකාරී ස්වරූපයක් ලෙස සළකන "සංඛාර" අදහස් කරනවා විය හැක. පුඤ්ඤ-පාප (පින්-පව්) තුළින් සංඛාර නිර්මාණය වන අතර ඒවා දීර්ඝ කාලීනව චිත්තය තුළ රඳා පවතියි. එසේම එහි ඵල විපාක ලැබීම ද දීර්ඝ කාලයක් තුළ සිදුවිය හැක. සංඛාර නිර්මාණය වන්නා වූ "කර්ම" ද චිත්ත පදනම් වූවකි.[23] සිතෙන් සිතීමෙන් අනතුරුව කර්ම සිදු කෙරේ. ඒවා "සචේතනික කර්ම" ලෙස සළකනු ලබන අතර "සංඛාර" නිර්මාණය වන්නේ මෙම සචේතනික කර්මයන් මඟිනි. මෙසේ කර්මය හා සංඛාර සම්බන්ධ වූ පුද්ගල යාන්ත්‍රික ක්‍රියාවලිය අවබෝධකොට ගත යුත්තේ "චිත්තය" තුළිනි. එම අවබෝධය සඳහා චිත්ත සංවරය, චිත්ත දමනය, චිත්ත පාලනය මූලික බුදුසමය තුළ උගන්වා ඇත. එසේ චිත්තය එකඟ වූ කල්හි, දමනය වූ කල්හි, පිරිසිදු වූ කල්හි, දීප්තිමත් වූ කල්හි, කිලිටිභාවය නැති වූ කල්හි, චිත්තෝපක්ලේෂ හැකි වූ කල්හි පුද්ගලයා විදර්ශනා ඥානය පිණිස අභිමුඛ වේ.[24] ඒ තුළින් පුද්ගල චිත්තය තුළ විශේෂ වූ ඥාන සම්භාරයක් ද නිර්මාණය වේ.[25] අවසානයේ "චිත්තය" මඟින්ම "චිත්තය" විමුක්තිය ලැබූ බව අවබෝධ කොට ගනී.

චිත්ත ස්වභාවය පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීමේ දී මෙම ධර්මතාවය හුදෙකලාව ක්‍රියාත්මක වන්නක් නොවේ. සිත තුළ ඇතිවන්නා වූ හැඟීම් මෙම චිත්ත යන වචනය තුළින් ප්‍රකට කෙරේ. එසේම සිතේ ඇති විෂය මූලික අංශය චිත්ත තුළින් ප්‍රකට වන අතර, සිත තුළ ඇතිවන්නා වූ චිත්තාවේග, චිත්ත ධාරාවන් සඳහා ද මධ්‍යස්ථානයක් බවට පත් වන්නේ මෙම චිත්තයයි. බොහෝ උගතුන්ගේ මතයන්ට අනුව "චිත්තය" යන්න සිතේ ආවේග පිළිබඳ වඩාත් ක්‍රියාත්මක පැතිකඩ නියෝජනය කරනු ලබයි. මේ නිසාම පුද්ගලයාගේ හැසිරීම් සම්බන්ධව ප්‍රමුඛ වන්නේ ද මෙම චිත්තයයි. එම නිසා චිත්ත යනු ජීවමාන අස්තිත්වයක් ලෙස බොහෝ විද්වතුන් පිළිගෙන ඇත. ආදි බුදුදහමේ දැක්වෙන "අනාවත්ති ධම්මං මෙ චිත්තං"[26] (මාගේ සිත නැවත ආපසු නොහැරෙන ධර්මතාවයකින් යුක්තයි.) යන ප්‍රකාශයෙන් අර්ථවත් වන්නේ සිතේ ග්‍රාමීය ක්‍රියාකාරිත්වය ඉක්මවා ඇති විටෙක නැවත එම ග්‍රාමීය තත්ත්වයට පත් නොවන බවයි. එහි දී "මනෝ" යන වචනය වෙනුවට "චිත්ත" යන වචනය යොදා ඇත්තේ සිතෙහි මෙම ආවේගාත්මක ක්‍රියාවලිය අර්ථවත් කිරීම පමණක් අපේක්ෂා කළ නිසායැයි සිතිය හැකිය. "යංච බො අස්ස චිත්තං දිඝානං සද්ධා පරිභාවිතං තං සුද්ධගාම හොති විසෙසගාමි"[27] (ඔහුගේ සිත බොහෝ කාලයක් සද්ධා පරිභාවිතයෙන් යුක්ත වූ බැවින් එය උඩට ගමන් කොට විශේෂත්වයට ගමන් කරයි.) මින් අදහස් වන්නේ සද්ධා, ශීල, ශ්‍රැති, ත්‍යාග, ප්‍රඥා ආදී වූ අංගයන් හා මුසුකොට ප්‍රගුණ කිරීමෙන් දියුණු කරගත හැකි බවයි. යමක් දියුණු කරගත හැකිවන්නේ ඒ තුළ භාවමය ශක්තියක් තිබුනේනම් පමණි. මෙහි දී බුදුසමය යොදා ඇත්තේ "චිත්ත" යන පදයයි. එයින් සිතේ ස්වීය වූ ලක්ෂණයන් ද පෙන්නුම් කරයි. එනම් එය ක්‍රියාකාරීත්වයට සම්බන්ධ වූ ස්වභාවයක් නියෝජනය කරන නිසාය. මෙම ක්‍රියාකාරී ලක්ෂණය සනාථ කරන තවත් අවස්ථාවක් අං.නි. හමු වේ. "නො චෙ භික්ඛු පරචිත්ත පරියාය කුසලො හොති. අථ සචිත්ත පරියාය කුසලො හොති. පරිස්සාය"[28] භික්ෂුවකට අනුන්ගේ සිත දැනගැනීමට කුසලතාවයක් නැති වුව ද තමාගේම සිත හඳුනාගැනීමට කුශලතාවයක් ඇතිවිය යුතු බව දක්වා ඇත්තේ

තමාගේම සිත භාවිත කොටගෙන එය ලබාගත හැකි නිසාය. මෙවැනිම වූ තවත් අවස්ථාවක් මජ්ඣිම නිකාය තුළ ද හමුවේ. "දීඝ රත්තං වත හො අහං ඉමිනා චිත්තෙන නිකතො වඤ්චිතො පලුද්දො"[29] (සැබවින්ම බොහෝ කාලයක් මෙම සිතෙන් මා වංචා කරන ලදී) යනුවෙන් පුද්ගලයා සිත කෙරෙන් මුලාවට පත්ව සිටින බවයි. සිත මුලාවට පත්වන්නේ ක්‍රියාකාරිත්වය නිසාය.

එසේම "චේතනා" යන පදය ගත්විට එය සෑදී ඇත්තේ ද චිත්තෙති යන පදයෙනි. " චිත්තෙති", "චේතේති", "චේතයති", "චේත්‍ය" යන වචනයන්ගෙන් සිතම අර්ථවත් කරන බව වචනාර්ථ විමසා බැලීමේ දී මනාව පෙනේ. මේ අනුව සිත හුදෙකලාව නොපවතින බව පැහැදිලි වේ. "සඤ්ඤා ච වේදනා ච චෙතසිකා එතෙ ධම්මා චිත්ත පටිබද්ධා"[30] මීට අමතරව ආදි බුදුදහම තුළ සාමාන්‍ය පුද්ගලයෙකුගේ සැලෙන වෙනස්වන සුළු මානසිකත්වය දක්වා ඇත්තේ ද[31] ලෝකය මෙහෙයවන ප්‍රධාන බලවේගය ලෙස දක්වා ඇත්තේ ද චිත්තයයි.[32]

මෙසේ අං.නි. තුළ ලෝකය මෙහෙයවන්නා වූ ප්‍රධානම බලවේගය ලෙස "චිත්ත" යන්න යොදා ඇති බැවින්, පෙළ දහමේ ඒ හා බැඳුණු සංකල්ප රාශියක් ඉදිරිපත් වී තිබේ. ඒ අතර ප්‍රකට සංකල්ප කීපයක් වේ.

- චිත්ත සමථ - සිත තැන්පත් කිරීම
- චිත්තානුපස්සනා - සිතේ පැවැත්ම සළකමින් භාවනා කිරීම
- චිත්ත දමනය - සිත සංවර කර ගැනීම
- චිත්ත ධර්මය - සිතේ ස්වභාවය
- චිත්ත නිරෝධය - සිත නිරුද්ධ වීම
- චිත්ත ධාතුව - ප්‍රකෘති සිත
- චිත්තඛණය - සිතක ආයුකාලය
- චිත්ත සමාදානය - සිත තැන්පත් බව
- චිත්ත සමාපත්තිය - සිතින් ඇතිවන ඉසුරුමත් බව
- චිත්ත සුඛය - සිතේ ඇතිවන සුඛය
- චිත්ත සංඛාර - සිතේ ඇතිවන සඤ්ඤා, වේදනා සිතුවිලි
- චිත්ත සන්තතිය - නොසිඳී පවත්නා සිතුවිල්ල
- චිත්ත වික්ඛේප - සිතේ නොසන්සුන් බව
- චිත්ත සංතාප - සිතේ තැවුල

මේ හැර සිත මුල් වූ චිත්ත පීඩාව, චිත්ත ප්‍රීතිය, චිත්ත රූප, චිත්ත වේග, චිත්ත ශක්තිය, චිත්ත වීර්‍ය, යන යෙදුම් හරහා චිත්ත සංකල්පයේ බහුවිධ වූ ස්වභාවයන් හා ක්‍රියාකාරීත්වය සිද්ධ වේ. සං.නි. තුළ චිත්ත ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් තුන් ආකාරයකට විග්‍රහ වේ.[33] එනම් සඤ්ඤාව, වේදනාව හා චේතනාව සිත හා බැඳී ක්‍රියාත්මක වන බවයි. ඒ තුළින් සුඛ, දුක්ඛ ආදි වූ සංවේදන චිත්තය තුළ

නිර්මාණය වේ. මෙම සංවේදනයන්ට අමතරව චිත්තයම පදනම් වී චේතනාව, කැමැත්ත, ආශාව, වීර්ය වැනි වූ අභිප්‍රේරණ ක්‍රියාවලීන් සිදුවන්නා වූ සංචේතනයන් ද නිර්මාණය වන බව අභිධර්ම අධ්‍යයනය තුළ දැකගත හැකි වේ. "මා අකුසලං චිත්තං චිත්යෙථ" (අකුසල සිත් නොසිතව්) යන්නෙන් පැහැදිලි වන්නේ ද "චිත්තය" තුළින් සිදුවන්නේ සිත හැසිරවීමේ ක්‍රියාවලිය සිදුකරනු ලබන බවයි. පුද්ගලයෙකුට සංචේතන ඇත්නම් චිත්තය මුල්කොටගෙන අකුසල චිත්තයක් නොසිතා සිතීමට හැකියාව ඇත. "සමුදය ධම්මානු පස්සි වා චිත්තස්සමිං විහරති"[34] (සිත සමුදය ලක්‍ෂණයට ප්‍රත්‍ය වූ ධර්මය දෙස සුවිශේෂි කොට බලමින්) මෙසේ මෙම ක්‍රියාවලිය තුළින් පෙන්නුම් කරනු ලබන්නේ චිත්තය පුද්ගලයෙකුගේ අවශ්‍යතා මත මෙහෙයවීමේ හැකියාවක් උරුමකරගන්නා බවයි. චිත්තය සක්‍රීය හෝ අක්‍රීය විය හැකිය. චිත්තය, චිත්තාවේග හා අභිප්‍රේරණයන් සමග ක්‍රියාත්මක වන්නක් වන අතර, එම නිසාම ආක්‍රමණශීලි ගති පැවතුම් චිත්තය ඇසුරුකොට ගෙන මෙහෙයවනු ලබයි. සිතේ ප්‍රධාන ක්‍රියාවලිය නම් සිතුවිලි නිර්මාණය කිරීමයි. එම නිසාම ලෝකය සිත තුළින් ඇදෙන බව දැක්වේ. " චිත්තේන නීයති ලොකො - චිත්තේන පරිකස්සති"[35] සිතේ කැළඹීම ඇති වන්නේ චිත්තය ආවේග ධර්ම හා සම්බන්ධ වීමෙනි. රාග, ද්වේශ, මෝහ සිත කළඹන අවයවයි. ඒවා පිළිබඳ අධ්‍යයනය කිරීමට සිදුවන්නේ ද චිත්තයම ඇසුරුකොට ගෙන ය. එසේම සිත කම්පා වීම, සෙලවීම "චිත්තං විකම්පති" වැනි අර්ථ පවා ප්‍රකාශ කරනු ලබන්නේ සිතේ ඇති මෙම ආවේගකාරී ක්‍රියාකාරිත්වය නිසාවෙනි. මෙසේ සළකා බැලීමේ දී "චිත්ත" යන පදය සිතේ භාවමය ක්‍රියාකාරීත්වය ප්‍රකාශ කිරීම සඳහා භාවිත කොට ඇතිබව පෙනේ. වර්ධනය හා සම්බන්ධව විමසීමේ දී සිත පිළිබඳව විමසිය යුතු කොටස් ප්‍රකාශ වනුයේ "චිත්ත" යන පදයෙනි. භාවනායෝගී වූ පුද්ගලයාට සිතේ මිදීමක් ඇතිකරගත හැකිය. "චිත්තං විමොච්චෙස්සති"[36] මෙසේ සිත නිදහස් කිරීම සිදුවිය යුතුව ඇත්තේ චිත්තය යන කොටස හා සම්බන්ධ වීමෙනි. එමෙන්ම සිත ආරක්ෂා කරගත යුතුව ඇත. "මුත්තං වා චිත්තං අනුරක්ඛිස්සති" (මිදුණු සිත ආරක්ෂා කරනු ලබයි.) මෙහි දී තම උත්සාහය තැබිය යුත්තේ චිත්තය පිළිබඳවය. සිත තුළ පිරිසිදුකම හෝ අපිරිසිදුකම නිර්මාණය වන්නේ චිත්ත නිසාවෙනි. මේ නිසා "චිත්ත" යන්න තුළින් මනසේ ක්‍රියාකාරී ගුණය ප්‍රකටව අර්ථවත් කරන බව දැක්විය හැකිය.

මීට අමතරව ආචාර විද්‍යාත්මකව හා ඥාන මීමංසාත්මකව "මනස" වැදගත් වන්නේ " චිත්ත" යන පදය එම ක්‍රියාවලීන් හා සම්බන්ධව ක්‍රියාත්මක වන නිසාය. සිතේ කුසල පක්‍ෂය සත්‍වයාගේ විමුක්ති සාධනය ඇති කරයි. එසේම සිත සමග අකුසල සිතුවිලි නිර්මාණය වීමෙන් පුද්ගල මනස අපිරිසිදු භාවයට පැමිණේ.[37] එහිදී සංජානනය, සංවේදනය, අකුසල වූ විට සමස්ථ චිත්තයම එම චිත්ත ස්වාභාවයට පාත්‍ර වෙයි. එම සිතුවිලිවල කේවල පාරිශුද්ධත්වය පුද්ගලයාගේ පූර්ණ විමුක්තිය නිර්මාණය කරන බව ද එහි දක්වා ඇත. "චිත්තං මෙ මුත්තං" (මගේ සිත මිදුණෙමි) මෙහි අර්ථය තම සිත අකුසල ක්‍රියාකාරීත්‍වයෙන් සම්පූර්ණයෙන් මිදුණු බවයි. මෙසේ සිත හා බැඳුණු සිතිවිලිවල ක්‍රියාකාරීත්‍වය ආචාර විද්‍යාත්මකව හෝ ඥානමීමංසාත්මකව ප්‍රකාශ කරනු ලබන්නේ ද "චිත්ත" යන පදය ඇසුරෙනි.

මීට අමතරව ඛු.නි. ධම්මපදය, චිත්ත කාණ්ඩය තුළ විග්‍රහ වන ආකාරයට සැලෙන්නා වූ ද, නොරැකිය හැකි වූ ද, නොවැළැක්විය හැකි වූ ද සිත නුවණැත්තා බවුන් වැඩීමෙන් හා මාර්ගඵල ලැබීමෙන්, යම් සේ වඩුවෙක් ඇද ලීයක් ගෙන එය ඇද හැර මනාව සකස් කොට ගන්නා සේ, ඍජු

බවට පත්කරගනු ලබයි.[38] යන දේශනාව තුළ දක්වා ඇත්තේ සිත යනු සංවර්ධනය කළ යුතු දෙයක් බවයි. පුහුදුන් වූ සිත නිරන්තරයෙන් සැලෙන්නේ එහි අවිද්‍යාව, අස්මිමානය, උපාදානය ආදි ක්ලේෂයෝ දැඩිව රැඳී ඇති බැවිනි. මේ නිසා සිදුකළ යුත්තේ චිත්ත පාරිශුද්ධිය සළසා ගැනීමයි. එසේ නොකළහොත් සියලු විපත්, වැරදි සිත නිසා සිදු වේ.[39] එසේම මනාකොට පිහිටි සිත නිසා පුද්ගලයා දස කුශල්හි යෙදෙන බව දක්වා ඇත.[40] ශ්‍රේෂ්ඨත්වය යහපත් වූ සිත නිසා නිර්මාණය වේ. ක්ලේශයන්ට යොමු වන්නා වූ සිත එයින් ආරක්ෂාවීම සැපය සඳහා වේ.[41] එසේම මෙම දේශනාවේ දැක්වෙන " සුදුද්දසං", "සුණිපුණං" යන පද දෙක සිත පිළිබඳ දැක්වෙන විශේෂණ පද දෙකකි. "සුදුද්දසං" යනු දැකිය නොහැකි බවයි. සිත රුවක් නොමැති අරූපී දහමක් වන බැවින් එය කිසිදු අයුරකින් ඉන්ද්‍රිය ගෝචර නොවේ. එසේම සිත ඉතාම සියුම් බව "සුණිපුනං" යන පදයෙන් දක්වා ඇත. සසර දිනාගැනීමට මුල්වන සිත, දිනා ගැනීම යන ක්‍රියාවලියේ දී සිත සකස්කරගත හැකි ප්‍රවණතා රාශියක් මේ තුළ ඇතුළත්ව තිබෙන අයුරු බුදුරජාණන් වහන්සේ සූත්‍ර දේශනා රාශියකම දක්වා ඇත. මේ අනුව ඉතාම වැදගත් කාර්යය වන්නේ සිත කුසල පක්ෂයට නැඹුරු කොට සංවර්ධනය කර ගැනීමයි. සිතේ පිරී පවතිනුයේ කිලිටි ධර්මයෝ නම් එම නිසාම සත්‍වයෝ කිලිටි බවට පත් වේ. එසේම සිත නොකිලිටි නම් එය හිමි තැනැත්තා පිරිසිදු අයෙකු බවට පත් වේ. මේ බව ම.නි. මූලපණ්ණාසකයේ වත්‍ථූපම සූත්‍රය තුළ මනාව විග්‍රහ වේ.[42] "සිත කිලිටි වූ කල්හි දුගතිය කැමැති විය යුතුය. සිත නොකිලිටි කල්හි සුගතියට කැමති විය යුතුය." මීට සමාන වූ අදහසක් සං.නි. තුළ ද හමු වේ.[43] මෙසේ විමුක්තිය සාක්ෂාත් කරගැනීම උදෙසා සිදුකරගත යුත්තේ චිත්ත විශුද්ධිය ඇතිකර ගැනීමයි. ම.නි. වත්‍ථූපම සූත්‍රයෙහි සිත අපිරිසිදු භාවයට හෙවත් කෙලෙසීමට පත්කරවන ධර්ම ගණනාවක් පිළිබඳව දක්වා ඇත.

- අභිධ්‍යාව - ස්වකීය වස්තුව පිළිබඳ ඇති ඇල්ම (අභිජ්ඣා විසම ලොභො)
- විෂම ලෝභය - අනුන්ගේ වස්තුව පිළිබඳ ඇති ලෝභය (උපක්කිලෙසෝ චිත්තස්ස)
- ව්‍යාපාදය - (ව්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසො)
- ක්‍රෝධය - (කෝධෝ චිත්තස්ස උපක්කිලෙසො)
- උපනාහය - බද්ධ වෛරය (උපනාහො චිත්තස්ස උපක්කිලෙසො)
- මක්ඛය - ගුණමකු බව (මක්ඛො චිත්තස්ස උපක්කිලෙසො)
- පලාසය - යුග ග්‍රාහය (පලාසො චිත්තස්ස උපක්කිලෙසො)
- ඊර්ෂ්‍යාව - (ඉස්සා චිත්තස්ස උපක්කිලෙසො)
- මසුරු බව - (මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසො)
- මායාව - (මායා චිත්තස්ස උපක්කිලෙසො)
- කපටි බව - (සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලෙසො)
- ථම්භය - තද බව (ථම්භො චිත්තස්ස උපක්කිලෙසො)
- සාරම්භය - (සාරම්භො චිත්තස්ස උපක්කිලෙසො)
- මානය - (මානො චිත්තස්ස උපක්කිලෙසො)

- අතිමානය - (අතිමානො චිත්තස්ස උපක්කිලෙසො)
- මදය - (මදො චිත්තස්ස උපක්කිලෙසො)
- ප්‍රමාදය - (පමාදො චිත්තස්ස උපක්කිලෙසො)

මීට අමතරව ම.නි. සීහනාද සූත්‍රය තුළ ද, චේතොඛිල සූත්‍රය තුළ ද චිත්ත පාරිශුද්ධිය පිළිබඳ බුද්ධ දේශනා දැකගත හැකි වේ. "මහණෙනි මේ කිසි භික්ෂුවකගේ සිතේ පස් වැදෑරුම් කෙලෙස් කසල ප්‍රහීණ වූයේ ද, විතර්කාදී බන්ධන මැනවින් සිඳී ගියේ ද හේ ඒකාන්තයෙන්ම මේ සසුනේ බැබලීමට, වැඩීමට, විපුලත්වයට පත් වෙයි."[44] පුද්ගලයා සුමඟට හෝ නොමඟට යොමුවන්නේ ඔහුගේ සිත ක්‍රියාත්මක වන ආකාරයට ය. සිතට මුල් වන්නා වූ චෛතසික විවිධ අරමුණු මුල්කරගෙන ගලායන ප්‍රවාහයක් වන අතර ඒ චිත්තය හැසිරවිය හැකි ස්වච්ඡන්දතාමය ශක්තියක් ද පුද්ගලයෙකුට ඇති බව මූලික සූත්‍ර දේශනා තුළින් අනාවරණය වේ. "නාම" නම් වූ මානසික ධර්ම අතර "චේතනා" වශයෙන් දැක්වෙන්නේ එකී ස්වච්චන්දතාමය ශක්තියයි. සූත්‍ර පිටකයේ වැඩි නැඹුරුතාවයක් දක්වා ඇත්තේ මේ ස්වච්ඡන්දතා ශක්තිය හා ඉන් ගොඩනගාගත් යෝනිසොමනසිකාරය යොදාගනිමින් සිත කිලිටිකරන ආසය, අනුසය, නීවරණ දුරුකර ඉන්ද්‍රීය ධර්ම, බල ධර්ම, බොජ්ඣංග ධර්ම වැඩීමෙන් මානසික සංවර්ධනයක් උදාකර ගැනීම පිළිබඳවය. නිරතුරු කෙලෙස් ගලන සිත ඉන් මුදවාගෙන සුපිරිසිදු කර ගැනීමේ බෞද්ධ චිකිත්සක ක්‍රමයේ විශ්වසාධාරණ වටිනාකමක් ගැබ්ව තිබේ.

ආදි බුදුසමය තුළ පුද්ගලයා නිරන්තරයෙන් අනුපස්සනාවට ලක්කළ යුතු ධර්මතාවයක් ලෙෂ " චින්තනය" දක්වා ඇත. ම.නි. සතිපට්ඨාන සූත්‍රයෙහි චිත්තානුපස්සනාව මෙසේ දක්වා ඇත."මහණෙනි, මහණතෙමෙ කෙසේ නම් සිතෙන් සිත නුවණින් බලන සුළුවූයේ වාසය කෙරේද? රාග වූ සිත, රාග සිතැයි විදර්ශනා නුවණින් දකී. ද්වේශ සහිත වූ සිත ද, මෝහ සහිත වූ සිත ද, ථීන මිද්ධයෙන් හැකිලුණු සිත ද, විසිර ගියා වූ සිත ද, රූපාවචර සිත ද, නොමිදුණා වූ සිත ද ආදි වශයෙන් වරින් වර සිතේ ඇතිවන විවිධ වූ චිත්ත පරම්පරාවන් ඒ ආකාරයෙන්ම විදර්ශනා නුවණින් දැකීම චිත්තානුපස්සනාව නම් වේ. ඊට අමතරව රාග රහිත වූ සිත, රාග රහිත යැයි විදර්ශනා නුවණින් දැකිය යුතුය. මේ ආකාරයෙන්ම ද්වේශ රහිත වූ ද, මෝහ රහිත වූ ද, මහග්ගත නොවූ ද, අනුත්තරවූ ද, සමාහිතවූ ද, මිදුණාවූ ද ආදි යහපත් වූ සිත් පරම්පරාව එහි යථා ස්වරූපයෙන් දැකගත යුතු අතර, එය චිත්තානුපස්සනාවයි. මෙසේ තමාගේ සිතේ හෝ අනුන්ගේ සිතෙහි හෝ තමාගේ මෙන්ම අනුන්ගේ සිතෙහිත් චිත්තානුපස්සීව වාසය කරයි. සිතේ හටගැන්ම, විනාශය, හටගැනීම හා විදර්ශනා නුවණින් දකිමින් වාසය කිරීම චිත්තානුප්ස්සනාවයි.[45] මෙසේ වූ චිත්තය පිරිසිදු කළ යුත්තක් ලෙස ද,[46] රැකිය යුත්තක් ලෙස ද දමනය කළ යුත්තක් ලෙස ද දැක්වේ. සිත පිරිසිදු කළ යුත්තේ එය අපිරිසිදු දෙයින් යුතුවන බැවිනි. රැකිය යුත්තේ දමනය කළ යුත්තේ හා ඍජු කළ යුත්තේ එවැනි නිවැරදි කිරීමකට ලක්කළ යුතු ප්‍රවණතා ඒ තුළ පවතින හෙයිනි. සූත්‍ර දේශනා තුළ විවිධ වූ ආස්‍රව, අනුසය ආදි ක්ලේශ ධර්මයෝ නිරන්තරයෙන් චිත්තය තුළ අන්තර්ගත බව දක්වා ඇත. මේවා පුද්ගල ජීවිතයේ කායික හා මානසික ක්‍රියාකාරීත්වයට ප්‍රබලව බලපායි. චිත්තයෙහි ඇත්තේ කිලිටි ධර්ම නම් ඒ සත්‍වයා කිලිටි වූ අයෙකි. සිත කිලිටි ධර්මවලින් පිරිසිදු නම් ඒ සත්‍වයා පිරිසිදුය. එබැවින් විමුක්ති මාර්ගයේ දී බුදුදහම අවධානය යොමුකරන්නේ "

චිත්තය" තුළ රැස් වූ කිලිටි දුරු කිරීම සඳහාය.[47] දී.නි. I සාමඤ්ඤඵල සූත්‍රයෙහි මෙබඳු වූ චිත්තය කිලුටට පත් කරන්නා වූ ප්‍රධාන කරුණු 05 ක් පිළිබඳ පඤ්චනීවරණ ධර්ම ලෙස විග්‍රහ වේ. එනම්,

1. කාමච්ඡන්ද - පසිඳුරන් පිනවීමට ඇති දැඩි ආශාව
2. ව්‍යාපාද - ද්වේෂය නිසා සිත කෝප වීම
3. ථීනමිද්ධ - සිතේ, කයෙ ඇති උදාසීන තත්ත්වය
4. උද්ධච්ච කුක්කුච්ච - සිතෙහි ඇති නොසන්සුන් තත්ත්වය
5. විචිකිච්ඡා - සිතේ පවත්නා සැකය

මෙම පඤ්චනීවරණයන්ගෙන් විනිර්මුක්ත වූ සිත් ඇති භික්ෂුව ණයකින් මිදුනු අයකු මෙන් බිය සහිත මගකින් ක්ෂේම භූමියකට පැමිණියෙකු සෙයින් ප්‍රබෝධයට සොම්නසට පැමිණේ. නීවරණ කළ සිතින් ප්‍රහාණය වූ බව දන්නා ප්‍රමුදිත භික්ෂුවගේ මනස ප්‍රීතියට පැමිණේ. ඉන් පසු ප්‍රීති මනසින් නාමකාය දෙකින් මිදේ. සන්සුන් වූ කය නිසා චිත්ත සමාධියට පැමිණේ.[48] එබැවින් එදිනෙදා ජීවිතය තුළ සිතට වසඟව කටයුතු සිදුකරන්නා වූ පුද්ගලයා විසින් සිත තමාට වසඟ කොට ගත යුතු බව බුද්ධ දේශනාවයි.[49] සං.නි. ගද්දුල බද්ධ සූත්‍රයේ දී සිත කිලුටට පත්වන ආකාරය මෙසේ විග්‍රහ වේ. "මහණෙනි, මෙම සිත ඉතාමත් දීර්ඝ කාලයක් මුළුල්ලේම කිලිටි භාවයට පත් වූයේ වෙයි. ඒ රාග, ද්වේෂ, මෝහ යන අකුසලයන්ගෙනි.[50] මෙම අකුසල ධර්මයන් නිසා සිත නිරතුරු කිලිටි භාවයට යොමු වේ. ම.නි. දන්තභූමි සූත්‍රයෙන් දැක්වෙන ආකාරයට සිත දමනය කිරීම පහසු කාර්යයක් නොවේ. අලුත් අයෙකුට අලුත් යමක් පුරුදු කරන්නාක් මෙන් ක්‍රමවත්ව බුද්ධිමත් ලෙස සිත දමනය කිරීම ද පුරුදු පුහුණු කළ යුතුය.[51] මේ සඳහා නිදසුන් ථෙරගාථා හා ථේරිගාථාවල දැකගත හැකිය. ථෙරගාථාවල එන විජිතසේන හිමියන්ගේ කතාවෙන් පැහැදිලි වන්නේ දක්ෂ ඇත්ගොව්වෙකු වනයෙන් ඇතෙකු අල්ලාගෙන ක්‍රමයෙන් හීලෑ කරන්නේ ද, දමනය කරන්නේ ද එසේම තම සිත ද දමනය කරගත් බව උන්වහන්සේ ප්‍රීතියෙන් ප්‍රකාශකොට ඇත.[52] ථේරගාථාවල එන පටාචාර ථෙරණියගේ කථාවෙන් ද පැහැදිලි වන්නේ අභියෝගාත්මක ලෙස සිත දමනය කරගත් බවයි. පටාචාරව ජීවිතයේ විඳිය යුතු සියලු දුක් කරදරවලට මුහුණ දී මානසිකව පසුබෑමකට ලක්ව සිටි කාන්තාවකි. ඇය ද ථේරිගාථාවල දී ඉතා ප්‍රීතියෙන් ප්‍රකාශ කරන්නේ දක්ෂ අශ්වයින් පුහුණු කරන්නෙකුට හීලෑ නොවූ අශ්වයෙකු හීලෑ කරන්නට හැකිනම් මිනිසාට තම සිත දමනය කරගත නොහැක්කේ මන්දැයි සිතමින් පහන අතින් ගෙන ආසනයේ වාඩි වී පහන නිවෙද්දීම සියලු කෙලෙසුන් දමනය වී ක්ෂය වූ බව ඉතා ප්‍රීතියෙන් ප්‍රකාශ කොට ඇත.[53]

මේ ආකාරයට සූත්‍ර පිටකයේ විස්තර වන්නා වූ චිත්ත සංකල්පය පිළිබඳ අදහස පසුකාලීනව ආභිධම්මිකයන් විසින් වඩාත් විස්තර වශයෙන් දැක්වීමටත් එහි ක්‍රියාකාරීත්වය විග්‍රහ කිරීමටත් යොමු වී ඇත. මෙම නිසාම ආභිධම්මික චිත්ත විග්‍රහය ශාස්ත්‍රීය භාවයක් ගෙන ඇත. ආභිධම්මිකයන්ට අනුව " චිත්ත'' යනු පරමාර්ථ ධර්මයකි.[54] සූත්‍ර පිටකයෙහි විස්තර වන්නා වූ චිත්ත, මනෝ, විඤ්ඤාණ යන ධර්මයෝ අභිධර්මයේ දී චිත්ත යන පරමාර්ථ ධර්මය යටතේ විග්‍රහ වේ. ආනුභවික හා කේවල වශයෙන්

චිත්තය පරමාර්ථ ධර්මයක් ලෙසට සළකනු ලබන අතර, ආනුභවික යථාර්ථයක් ලෙස ආභිධම්මිකයන් දක්වන්නේ නාම-රූප ධර්මයෝ ය. සම්මුති වශයෙන් පුද්ගලයෙකු පිළිබඳ සළකා ඇත ද පරමාර්ථය වශයෙන් පුද්ගලභවයක් පිළිබඳ ආභිධම්මිකයන් සළකන්නේ නැත. සිත නිර්වචනය කළ ආභිධම්මිකයන් ආකාර කීපයක් යටතේ එය දක්වයි. එහි ප්‍රධාන කොටස් 03 කි.

I. කත්තු සාධන
II. කරණ සාධන
III. භාව සාධන

රූපාදී අරමුණු සිතන හෙයින්, දැනගන්නා හෙයින් චිත්ත නම් වේ.[55] මෙම විග්‍රහය තුළ කර්තෘ සාධනය වේ. අරමුණු දැනගන්නා වූ කෙනෙක් ඇති බව මෙයින් කිය වේ. එසේම කරණ සාධනය තුළින් යම් උපකරණයක් මාධ්‍ය කොටගෙන අරමුණු හඳුනාගන්නා බව දැක්වේ.[56] අරමුණු ලෙසින් සිත හා එක්ව යෙදෙන ධර්මයන් මෙය කරණකොට ගෙන සිතන හෙයින් චිත්ත නම් වේ. මෙහි චිත්ත යන්න උපකරණයකි. මෙය කරණ සාධනයයි. භාව සාධනය යන්න ආභිධම්මිකයන් "චින්තන මත්තං චිත්තං" යනුවෙන් දක්වයි. චින්තන මාත්‍රය සිත වේ. එනම් සිතීමම සිත ලෙසට නිර්වචනය කර දී ඇත. කර්තෘ හා කරණ යන දෙක සිතේ නියම ප්‍රවෘත්තිය ප්‍රකට නොකරන බව උගතුන්ගේ මතයයි. එහෙත් භාව සාධනය තුළින් සිතේ ක්‍රියාමාත්‍රභාවය අර්ථවත් කොට ඇත. සත්ත්ව, පුද්ගල, ආත්ම වශයෙන් නොසළකා ස්කන්ධ, ධාතු, ආයතන අර්ථයෙන් පරමාර්ථ ධර්මයන් විග්‍රහ කරන අභිධර්මය සිතීමක් මිස සිතන්නෙකු නැත යන භාවාර්ථයෙන් තුන්වන නිර්වචනය දක්වා ඇත. බුද්ධඝෝෂ හිමියන්ගේ නිර්වචනය පවා කර්තෘ හෝ කරණ නිර්වචනයන්ගෙන් සම්ප්‍රයුක්ත වී ඇත. බුද්ධදත්ත හිමියන්ගේ නිර්වචනය තුළ භාවාර්ථය ගම්‍යමාන වේ. උන්වහන්සේ ඒ ඒ විෂයන් කෙරෙහි සිතේ අවදිකම ඇතිකරන හෙයින් කිරීමට උත්සහවත් වූ ඒ සඳහා නියැලීමේ අර්ථය ගම්‍යමාන කරමින් "චිත්ත" යන පදය විස්තර කර දී ඇත.[57]

චිත්ත පිළිබඳ විධිමත් වූ අර්ථ නිරූපණයක් කිරීමට උත්සාහවත් වූ අටුවාචාරීන් වහන්සේලා සම්ප්‍රදායානුකූලව සිත සතරාකාර මිණුම් දණ්ඩක් ඔස්සේ විග්‍රහ කරයි.

1. ලක්ඛණ (ස්වභාව)
2. කිච්ච (ක්‍රියාව)
3. පච්චුපට්ඨාන (ඵලය එළඹ සිටින ආකාරය)
4. පදට්ඨාන (ආසන්න කාරණය)

ධම්මසංගණී අටුවාවට අනුව සිතේ ලක්ෂණය නම් විෂය දැනගැනීමයි.[58] සිතෙහි කෘත්‍ය නම් චෛතසික ධර්මයන්ට ඉදිරියෙන් යැමයි.[59] සිතෙහි එළඹ සිටි ආකාරය නම් එකතු කිරීමයි.[60] එනම් චෛතසික ධර්ම හා එකතු කිරීමයි. එහි ආසන්න හේතුව නම් නාම-රූප ධර්මයි.[61] අභිධර්ම පිටකයට අනුව චිත්තය ප්‍රවාහයකි. එහි සිත් පහල වේ. සිත යනු විෂය දැනුමයි. ඇසකින් රූප දැකීම යනු සිත කරණ කොටගෙන රූප පිළිබඳව දැනීම ලබාගැනීමයි. මානසික අවයවයන්ගෙන් තොරව චිත්තයක් නිර්මාණය නොවේ. මේ නිසාම චිත්ත සහ චෛතසික ධර්ම අතර අවියෝජනීය වූ සම්බන්ධතාවයක්

දැකිය හැකිය. චිත්තය ක්‍රියාකාරී ස්වාභාවයට පත්වන්නේ චෛතසික ධර්ම සමඟ ඇති මෙම අවියෝජනීය වූ සබඳතාවය නිසාමය. එක්ව හටගැනීම (එකුප්පාද) එක්ව නිරුද්ධ වීම (එකනිරොධ) එකම අරමුණක පැවැත්ම සහ එකම අරමුණක් වස්තු කොට ගැනීම මෙම අවියෝජනීය වූ සබඳතාවයෙහි ලක්ෂණයයි. මෙසේ චිත්ත සමඟ සම්බන්ධව ක්‍රියාකරන චෛතසික සංඛ්‍යාත්මකව 52 ක් දක්වා ඇත. සිත සෑම විටම මෙම චෛතසික ධර්ම සමග යෙදේ. පඤ්චස්කන්ධ විග්‍රහයේදී පවා විඤ්ඤාණස්කන්ධය යටතේ සිත් සියල්ලක්ම සංග්‍රහ කොට ඇත. වේදනා, සංඥා, සංඛාර යන මානසික අවයවයන් මෙම චිත්තය සමග එකට යෙදී ක්‍රියාකාරී වේ. මේ නිසාම භාවාර්ථයෙන්ම චිත්තය අර්ථවත් කිරීමට සුදුසු බව පෙනේ. ආභිධම්මිකයන් මෙසේ ක්‍රියාත්මක වන චිත්තය නියාම ධර්මයක් ලෙස ද විග්‍රහ කරනු ලබයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අර්ථකතනයන්ට අනුව අරමුණක් ඉන්ද්‍රිය ද්වාරයක් ආපාතගත වූ පසුව ආකස්මිකව සිතේ අරමුණු පිළිගැනීම, නිශ්චිත කිරීම, යෙදීම, මතකයට ඇතුලු කිරීම වැනි ක්‍රියාවලියක් බලපෑමකින් තොරව රිද්මයට අනුව සිදුවන බව පෙන්වන අතර මෙම මනෝ ක්‍රියාවලිය චිත්ත නියාමයක් ලෙසට ආභිධම්මිකයන් ද විග්‍රහ කොට ඇත. ඔවුන් එසේ විස්තර කරමින් සිත් පහලවන භූමිවල ස්වභාවය සළකා සිත ප්‍රධාන වශයෙන් කොටස් 04 කට බෙදා දක්වයි. එනම්,

1. කාමාවචර සිත් 54
2. රූපාවචර සිත් 15
3. අරූපාවචර සිත 12
4. ලෝකෝත්තර සිත් 08[62]

එකොළහක් පමණ වූ කාමාවචර භූමිවල ජීවත්වන සත්‍වයන්ට පහලවන සිත් කාමාවචර නමින් හඳුන්වනු ලබයි. රූපාවචර බ්‍රහ්මලෝක 16ක් වන අතර, එහි ජීවත්වන සහ එම ලෝකවලට සම්බන්ධව පහලවන සිත් 15ක් වේ. ඒවා රූපාවචර සිත් නම් වේ. එසේම අරූපාවචර ලෝක 04ක් වන අතර, එම ලෝක හා සම්බන්ධව පහලවන සිත් 12කි. ඒවා අරූපාවචර සිත් නම් වේ. මෙම සියලුම සිත්වලට වඩා ශ්‍රේෂ්ඨ වන්නේ ලෝකෝත්තර චිත්තයයි. ඒවා ගණනින් 08කි. එම සිත් පහළ කරන්නේ ආර්ය ශ්‍රාවකයින් විසිනි. එම සිත් උපදවා ගැනීම සසර දුකින් නිදහස් වීමට උපකාරී වේ. මෙම සිත් බෙදීමේ දී සංඛත, අසංඛත, සෝමනස්ස, දෝමනස්ස, උපෙක්ඛා, දිට්ඨි සම්පයුක්ත, දිට්ඨි විප්පයුක්ත, ඤාණ සම්පයුක්ත, පටිඝසම්පයුක්ත, විචිකිච්ඡා සම්පයුක්ත, උද්ධච්ඡ සම්පයුක්ත ආදි වශයෙන් විවිධාංගයන් පදනම් කරගනිමින් සිත විස්තර කරයි. මේ ආකාරයෙන් ගත්විට අභිධර්මයේ දී පවා දක්නට ඇත්තේ "චිත්ත" යනු භාවාර්ථය හගවන්නා වූ පදයක් ලෙසිනි. චින්තෙති, චෙතෙති, චේතයති, චේතනා ආදි ලෙසින් සිතීම් මාත්‍රයම චිත්ත යන්නෙන් අර්ථවත් කිරීමට මහන්සිගෙන ඇත. චිත්තය යටතේ කරුණු විමසන විට ඒ තුල සංචේතනයත්, සංජානයත්, සංවේදනයත් ක්‍රියාත්මක වේ. මේ නිසාම ආභිධම්මිකයන් 52ක් චෛතසික ධර්ම චින්තය හා අවියෝජනීයව පවතින ධර්ම ලෙසට විස්තර කර දී අත්තේ සිතේ ඇති භාවමය ස්වරූපය තවත් අවධාරණය කිරීමට බව සිතිය හැකිය. මේ නිසා "මනෝ" යන වචනය ඉන්ද්‍රියාර්ථයෙන් දැක්වෙන අතර "චිත්ත" යන්න භාවාර්ථයෙන් දක්වා ඇත්තේ චිත්තය, සංඥා, වේදනා, සහ අනෙකුත් සංවේදන සියල්ලක්ම සංගෘහිතව පවතින නිසාය. මෙම ලක්ෂණ නිසාම චිත්තය පාලනය කළ හැකි ධාතුවක් ලෙසට බුදුසමය හඳුන්වා ඇත.[63]

[1] පරියාය දෙසිතො බො ආනන්ද මයා ධම්මො
**ම.නි., II බහුවේදනීය සුත්ත, බු.ජ.මු., පි. 102.**

[2] යඤ්ච බො එතං භික්ඛවේ වුච්චති චිත්තං ඉතිපි මනො ඉතිපි විඤ්ඤාණං
**ස.නි. I., බු.ජ.මු., පි. 48**

[3] කතමං තස්මිං සමයෙ චිත්තං හොති, යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්‍ද්‍රියං විඤ්ඤාණක්ඛන්‍ධො තජ්ජො මනො විඤ්ඤාණධාතු ඉදං තස්මිං සමයෙ චිත්තං හොති.
**බු.නි., මහානිද්දෙසපාලි, අට්ඨකවග්ග, කාමසුත්තනිද්දෙස.**

[4] ආරම්මණං මිනමානං ජානාතීති මනො
**අත්ථසාලිනි, 294 PTS**

[5] මානසත්ති මනො එව, අන්තලික්ඛචරො පාසො ය්වායං චරති මානසොති
**සං.නි. මාරසංයුක්ත, මනසසුත්ත**

[6] එත්ථ පන සම්පයුක්තක ධම්මො මානසොති වුත්තො
**අත්ථසාලිනි. 294. PTS**

[7] හදයන්ති චිත්තං, එත්ථ උරො හදයන්ති වුත්තං
**අත්ථසාලිනි. 294. PTS**

[8] **සුත්ත නිපාතය, ආළවක සූත්‍රය, බු.ජ.මු., 56 පිටුව,**

[9] **ම.නි., අනඞ්ගණ සුත්ත, බු.ජ.මු., 72 පිටුව.**

[10] භවංගං සන්ධායෙතං වුත්තං. පභස්සරමිදං භික්ඛවෙ චිත්තං තඤ්ච බො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං
**අං.නි. I, පණිහිත අච්ඡයවග්ග, P. 10, PTS**

[11] මනො මනායතනන්ති ඉධ පන මනොග්ගහණං මනස්සෙව ආයතනභාවදීපනත්ථං තෙනෙතං දීපෙති නයිදං දෙවායතනංවිය මනස්ස ආයතනත්තා මහායතනං.
**අත්ථපාලිනි. PTS**

[12] විජානාතීති විඤ්ඤාණං
**විසුද්ධි මග්ග 17, පඤ්ඤාභූමිනිද්දේස**

[13] විජානාති විජානාතීති බො ආවුසො තස්මා විඤ්ඤාණන්ති වුච්චති. කිඤ්ච විජානාති? සුඛන්ති පි විජානාති. දුක්ඛන්තිපි විජානාති. අදුක්ඛමසුඛන්ති පි විජානාති.
**ම.නි. I, මහාවේදල්ල සූත්‍රය**

[14] විඤ්ඤාණමෙව ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො
**බු.නි. මහානිද්දෙස අට්ඨකථා, කාමසුත්තනිද්දෙවණ්ණනාඅත්ථසාලිනි**

[15] තජ්ජා මනොවිඤ්ඤාණධාතුති තෙසං ඵස්සාදීනං ධම්මානං අනුච්ඡවිකා මනොවිඤ්ඤාණධාතු
**බු.නි. මහානිද්දෙස අට්ඨකථා, කාමසුත්තනිද්දෙවණ්ණනාඅත්ථසාලිනි**

[16] **සං.නි. II, බු.ජ.මු., 38 පිට**

[17] චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො. ඵස්ස පච්චයා වෙදනා යං වෙදෙති තං සංජානාති. යං සංජානාති තං විතක්කෙති. යං විතක්කෙති තං පපඤ්චෙති. තතො නිදානං පුරිසං පපඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති. අතීතානගත පච්චුප්පන්නෙසු චක්ඛු විඤ්ඤෙය්‍යෙසු රූපෙසු
**ම.නි. I, මධුපිණ්ඩික සුත්ත, බු.ජ.මු., පිට 280.**

[18] යථාගාරං දුච්ඡන්නං - වුට්ඨී සමති විජ්ඣති
එවං අභාවිතං චිත්තං - රාගො සමති විජ්ඣති
යථාඅගාරං සුච්ඡන්නං - වුට්ඨී න සමති විජ්ඣති
එවං සුභාවිතං චිත්තං - රාගො න සමති විජ්ඣති
**බු.නි., ධම්මපද පාළි, යමක වග්ග, 13, 14 ගාථා**

[19] දිසො දිසං යං තං කයිරා - වෙරි වා පන වෙරිනං
මිච්ඡා පණිහිතං චිත්තං - පාපියොනං තතො කරෙ
**බු.නි. ධම්මපද පාළි, චිත්ත වග්ග,10 ගාථාව**

[20] **බු.නි. ධම්මපද පාළි, චිත්ත වග්ග, 6,7 ගාථා**

[21] දුන්නිග්ගහස්ස ලහුණො - යත්ථ කාම නිපාතිනො
චිත්තස්ස දමතො සාධු - චිත්තං දන්තං සුඛාවහං
**බු.නි. ධම්මපද පාළි, චිත්ත වග්ග, 03 ගාථාව**

[22] තස්ස යොහි ක්වායං කායො රූපි තං ඉධේව කාකාවා බාදන්ති. යඤ්ච තස්ස චිත්තං දීඝරත්තං සද්ධා පරිභාවිතං සීල.... සුත..... චාග..... පරිභාවිතං පදගාමි හොති. විසේසගාමි.
**සං.නි. II අංක 14, , බු.ජ.ත්‍රි.ග්‍ර.මා., පිට 36**

[23] චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි. චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා.
**අං.නි. මහා වග්ග, ඡක්ක නිපාත පාළි,නිබ්බෙධික සූත්‍රය**

[24] සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනංගනෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ අනෙඤ්ජපත්තෙ චේතොපරියාය ඤාණාය චිත්තං අභිනීහරති. අභිනින්නාමේති.
**දී.නි. I, කේවට්ඨ සුත්ත, බු.ජ.මු. 320 පිට.**

[25] සො පරසත්තානං පරපුග්ගලානං චේතසා චෙතො පරිච්ච පජානාති.
**දී.නි., සීලකඛන්ධවග්ගපාළි, සාමඤ්ඤඵල සුත්ත**

[26] **අං.නි., පඤ්චක නිපාතය, නීවරණවග්ග, උපජ්ඣාය සුත්ත**

[27] **සං.නි., සොතාපත්ති සංයුත්ත, පඨමමහානාම සුත්ත.**

[28] **අං.නි., දසක නිපාතපාළි, ථෙර වග්ග, බ්‍යාකරණ සුත්ත**

[29] **ම.නි., මජ්ඣමපණ්ණාසපාළි, පරිබ්බාජක වග්ග, මාගණ්ඩිය සුත්ත**

[30] **ම.නි., මූලපණ්ණාසපාළි, චූළයමක වග්ග, චූළවෙදල්ල සුත්ත.**

[31] ඵන්දනං චපලං චිත්තං - දුරක්ඛං දුන්නිවාරයං
උජුං කරොති මෙධාවි - උසුකාරොව තෙජනං
**බු.නි. ධම්මපදය, චිත්ත වග්ගය, 1 ගාථාව**

[32] චිත්තෙන නීයති ලොකො - චිත්තෙන පරිකස්සති
චිත්තස්ස එක ධම්මස්ස - සබ්බෙව වසමන්ගුනි
**සං.නි., සගාථා වග්ග, දෙවතාසංයුත්ත, චිත්ත සුත්ත**

[33] සඤ්ඤාච වේදනා ච චෙතසිකා ච චතෙ ධම්මෙ චිත්ත පටිපදා
**ම.නි., මූලපණ්ණාසපාළි, චූළයමක වග්ග, චූළවෙදල්ල සුත්ත.**

[34] **දී.නි., මහාවග්ගපාළි, මහා සතිපට්ඨාන සුත්ත**

[35] **සං.නි., සගාථා වග්ග, දෙවතාසංයුත්ත, චිත්ත සුත්ත**

[36] **දී.නි., මහාවග්ගපාළි, මහාපදාන සුත්ත**

[37] චිත්ත සංකිලෙසා භික්ඛවෙ සත්තා සංකිලිස්සන්ති
**දී.නි., මහාවග්ගට්ඨකථා මහාසතිපට්ඨානසුත්තවණ්ණනා**

[38] **බු.නි. ධම්මපදය, චිත්ත වග්ගය, 1 ගාථාව**

[39] මිච්ඡා පණිහිතං චිත්තං පාපියොනං තතො කරෙ
**බු.නි. ධම්මපදය, චිත්ත වග්ගය, 10 ගාථාව**

[40] සම්මා පණිහිතං චිත්තං සෙය්‍යසොනං තතො කරෙ
**බු.නි. ධම්මපදය, චිත්ත වග්ගය, 11 ගාථාව**

[41] චිත්තං ගුත්තං සුඛාවහං
**බු.නි. ධම්මපදය, චිත්ත වග්ගය, 03 ගාථාව**

[42] චිත්තෙ සංකිලිට්ඨෙ දුග්ගති පාටිකංඛා.....
චිත්තෙ අසංකිලිට්ඨෙ සුග්ගති පාටිකංඛා.....
**ම.නි., මූලපණ්ණාසකය, වත්‍ථූපම සුත්ත,**

[43] චිත්ත සංකිලෙසො භික්ඛවෙ සත්තා සංකිලිස්සන්ති. චිත්ත වොදානා භික්ඛවෙ සත්තා විසුජ්ඣන්ති.
**දී.නි., මහාවග්ගට්ඨකථා මහාසතිපට්ඨානසුත්තවණ්ණනා**

[44] යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුනො පඤ්ච චෙතොඛිලා පහීනා ඉමෙ පඤ්ච චෙතසොවිනිබන්ධා සුසමුච්ඡින්නා සො වතිමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සතීති ඨාන මෙතං විජ්ජති.
**ම.නි., මූලපණ්ණාසපාළි, සීහනාද වග්ග, චෙතොඛිල සුත්ත**

[45] **ම.නි. I සතිපට්ඨාන සූත්‍රය 144 පිට.**

[46] රූපෙන සංකිලිට්ඨෙන සංකිලිස්සන්ති මාණවා
රූපෙ සුද්ධෙ විසුජ්ඣන්ති - අනක්ඛාතං මහෙසිනා

චිත්තෙන සංකිලිට්ඨෙන - සංකිලිස්සන්ති මාණවා
චිත්තේ සුද්ධෙ විසුජ්ඣන්ති - ඉති වුත්තං මහෙසිනා
**දී.නි., මහාවග්ගට්ඨකථා මහාසතිපට්ඨානසුත්තවණ්ණනා**

[47] **සං.නි. III 15 පිට.**

[48] තස්සිමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වේදෙති. සුඛිනො චිත්තං සමාධියති.
**දී.නි. I, සීලක්ඛන්ධ වග්ග, පොට්ඨපාද සුත්ත.**

[49] චිත්තං වාසං වත්තෙති නො ච භිකඛු චිත්තස්ස වසෙන වත්තති
**ම.නි., මූලපණ්ණාසපාළි, මහා යමක වග්ග,මහා ගොසිඞ්ග සුත්ත**

[50] දීඝරත්තොව භික්ඛවෙ ඉමං චිත්තං සංකිලිට්ඨා රාගෙන දොසෙන මොහෙන
**සං.නි. ඛන්ධ වග්ගය, බු.ජ.මු. පිටුව 15**

[51] **ම.නි. දන්තභූමි සුත්ත II 310 පිටුව.**

[52] ඔලග්ගෙස්සාමි තෙ චිත්ත - අණිද්වාරෙව හත්ථිනං
න තං පාපෙ නියොජෙස්සං - කාමජාල සරීරජ
**බු.නි., ථෙරගාථාපාළි, පඤ්චක නිපාත, විජිතසේනත්ථෙර ගාථා, බු.ජ.මු. 32 පිටුව.**

[53] තතො චිත්තං සමාධෙසිං - අස්සං භද්‍රවෙජානියං
තතො දීපං ගහෙත්වාන - විහාරං පවිසිං අහං
සෙය්‍යා ඔලොකයිත්වාන - මඤ්චකම්හි උපාවිසිං
තතො සූචිං ගහෙත්වාන - වට්ටිං ඔකස්සයාමහං
පදීපස්සෙව නිබ්බානං - විමොක්ඛො අහු චේතසො.
**බු.නි., ථෙරිගාථාපාළි, පඤ්චක නිපාත, පටාචාරාථෙරිගාථා බු.ජ.මු. 113 පිටුව.**

[54] චිත්තං චෙතසිකං රූපං නිබ්බාණං ඉති සබ්බතා පරමත්ථං පවක්ඛාමි.
**අභිධම්මාවතාරො, පඨම පරිච්ඡෙදො, චිත්ත නිද්දෙසො**

[55] රූපාදී ආරම්මණං චින්තෙති විජානාති ඉති චිත්තං
**බු.නි., පටිසම්භිදාමග්ග අට්ඨකථා, මහා වග්ග, ඤාණකථා, ධම්මනානත්තඤාණනිද්දෙසවණ්ණනා**

[56] චිත්තෙති වා එතෙන කාරණභූතෙන සම්පයුක්ත ධම්මානි චිත්තං...
**බු.නි., පටිසම්භිදාමග්ග අට්ඨකථා, මහා වග්ග, ඤාණකථා, ධම්මනානත්තඤාණනිද්දෙසවණ්ණනා**

[57] තත්ථ චිත්තං ඉති විසය විජානනං චිත්තං
**අභිධර්මවිකාසිනියට්ඨකථා**

[58] ලක්ඛණදිනො පන විජානන ලක්ඛණං
**අභිධම්මපිටක, ධම්මසඞ්ගණී අට්ඨකථා**

[59] පුබ්බංගම රසං
**අභිධම්මපිටක, ධම්මසඞ්ගණී අට්ඨකථා**

[60] සංධාන පච්චුපට්ඨානං
**අභිධම්මපිටක, ධම්මසඞ්ගණී අට්ඨකථා**

[61] නාම - රූප පදට්ඨානං
**අභිධම්මපිටක, ධම්මසඞ්ගණී අට්ඨකථා**

[62] **අභිධම්මත්ත සංගහ, චිත්ත ඛාණ්ඩය**

[63] චිත්තං භික්ඛවෙ දන්තං ගුත්තං භාවිතං සංඥතං රක්ඛිතං නාතො අත්තස්ස සංවත්තති.
**අං.නි., එකක නිපාතය, අදන්ත වග්ග**